**මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම - 2017**

-----------------------------------------------------------------------------------------------

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයෙහි ("සමූහය") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ පාඩු සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළිවෙලින් මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා විසින් ලබා ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 කරුණු අවධාරණය කිරීම

----------------------------

මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, පරිපාලිත සමාගම වන සීමාසහිත එම්බීඑස්එල් රක්ෂණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මා විසින් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 44 හි සඳහන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය කෙරෙහි අවධානය යොමු කෙරේ.

#### 2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව

---------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගමේ පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පහත කරුණු සඳහන් කරමි.

(අ) මතය පිළිබඳ පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණන සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත්ය,

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිය සහ 153 වගන්තියට අනුකූල වන බවත්ය.

- කෙසේ වුවද, පරිපාලිතයේ ශුද්ධ වත්කම්, ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අර්ධයකටත් වඩා අඩු බවත්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 44 හි පැහැදිලි කර ඇති පරිදි, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාරව ප්‍රාග්ධන තත්ත්වය පිළිබඳ බරපතල පාඩුවකට මුහුණ දෙන බවත් අවධානයට ලක් කළ යුතුය.

- මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 44 හි පැහැදිලි කර ඇති පරිදි, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ (සංශෝධන) 53 වගන්තියට අනුකූලව පරිපාලිතය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ලෙස වෙනම සමාගම් දෙකකට වෙන්කර නොමැත.

- පරිපාලිතයේ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සඳහා හා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ රෙගුලාසිය මගින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය "නුබුන්වත් ආන්තිකය

(අවදානම පදනම් වූ ප්‍රාග්ධනය) 2015 රීතිය" සඳහා අවශ්‍ය අවම ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරන අතර ජීවිත රක්ෂණ ව්‍යාපාරය විසින් ලබාගත හැකි මුළු ප්‍රාග්ධනය සඳහා අවශ්‍ය අවම ප්‍රවේශ ලක්ෂ්‍යය සම්පූර්ණ නොකරයි.

## 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම්

### 2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.මු.වා.ප්‍ර/ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූලව, සමූහයේ මූල්‍ය ප්‍රකාශන, සමාගමේ සහ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීමෙන් සකස් කරන ලද්දකි. පරිපාලිත සමාගම වන එම්බීඑස්එල් රක්ෂණ සමාගමේ අයිතියෙන් සියයට 84.12 ක් ද, ආශ්‍රිත සමාගම වන ලංකා සිකුයුරිටීස් (පෞද්ගලික)සමාගමෙන් සියයට 29 ක අයිතියක් ද, සමාලෝචිත වර්ෂය අවසානයට සමාගම සතුව පවතී. 2017 දෙසැම්බර් 31 දිනට හා ඉකුත් වර්ෂය අවසානයට ඉහත සමාගම්වල ආයෝජනයන්හි තත්ත්වය පහත පරිදි විය.

| සමාගමේ නම | ආයෝජනයේ තත්ත්වය | |
|---|---|---|
| | **2017**<br>**රු.'000** | **2016**<br>**රු.'000** |
| **පරිපාලිතය - ව්‍යාපාර වෙළඳපොළේ සුරැකුම් නැති සමාගම** | | |
| එම්බීඑස්එල් රක්ෂණ සමාගම | 516,096 | 516,096 |
| අඩුකළා - හානිකරණය සඳහා වෙන්කිරීම් | (494,979) | (438,790) |
| **ශුද්ධ ආයෝජනයන්** | **21,117** | **77,306** |
| | | |
| **ආශ්‍රිත - ව්‍යාපාර වෙළඳපොළේ සුරැකුම් නැති සමාගම්** | | |
| ලංකා සිකුයුරිටීස් (පුද්ගලික) සමාගම | 81,084 | 81,084 |
| අඩුකළා - හානිකරණ සඳහා වෙන්කිරීම් | - | - |
| **ආශ්‍රිතවල ශුද්ධ ආයෝජන** | **81,084** | **81,084** |
| **මුළු ආයෝජනයන්** | **102,201** | **158,390** |

## 2.3 සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.3.1 දීර්ඝ කාලීන හිඟහිටි ශේෂ - වෙනත් වත්කම්

(අ) වර්ෂය අවසානයට වෙනත් ණයගැතියන්, නීති ශාස්තු සහ බැංකු ඇපකර පිළිබඳ හිමිකම් සම්බන්ධයෙන් වූ දීර්ඝ හිඟහිටි ශේෂ පිළිවෙළින් රු.5,359,147, රු.1,313,886 සහ රු.1,776,489 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීම අවිනිශ්චිතය.

(ආ) රක්ෂණ නියෝජිත ආයතනයේ ලැබියයුතු මුළු කොටස් මුදල වූ රු.මිලියන 14 න්, රු.10,614,474 ක ශේෂයක් වසරකට වඩා වැඩි කාලයක සිට හිඟහිටව පැවතුණි.

**2.3.2 දීර්ඝ කාලීන හිඟහිටි ශේෂ - වෙනත් වගකීම්**

(අ) ණයගැති ශේෂවල ඇතුළත් රු.11,625,290 ක ශේෂයක් වසරකට වඩා වැඩි කාලයක සිට හිඟහිටව පැවතුණි.

(ආ) වසර අවසානයට වටිනාකම රු.17,352,539 ක් වූ අවිකරණිත (වෙනස් නොකළ) සෘජු තැන්පතු සහ රු.13,374,061 ක් වූ ඉදිරිපත් නොකරන ලද ගෙවීම්, පිළිවෙළින් මාස 6 කට සහ වසරකට වඩා වැඩි කාලයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශනවල හිඟහිටව පැවතුණි.

(ඇ) වටිනාකම රු.33,727,741 ක නොසැසඳූ ශේෂයක් අවිනිශ්චිත ගිණුමේ නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

**2.3.3 සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්**

වටිනාකම රු. මිලියන 543.8 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් බැංකුව විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබයි. කෙසේවෙතත්, වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාල සමාලෝචනය කිරීම සඳහා සාධාරණ ලේඛනගත කිරීමක් සහිත විධිමත් ක්‍රියාවලියක් බැංකුව සතුව නොපැවතුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 239.46 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 239.83 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 0.37 ක හෙවත් සියයට 0.15 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය වූ රු.මිලියන 232.9 සමඟ සැසඳීමේදී, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය පරිපාලිතය හැර රු.මිලියන 228.65 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 4.25 ක් හෙවත් සියයට 1.82 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී ණය සඳහා හානිකරණ ගාස්තු රු.මිලියන 24.24 සිට රු.මිලියන 244.23 දක්වා වැඩිවීම, ඉහත අඩුවීම සඳහා බලපා තිබුණි.

**3.2 අගය එකතු කිරීමේ ප්‍රකාශනය**

සමලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ අගය එකතු කිරීම පිළිවෙළින් රු.මිලියන 1,544 සහ රු.මිලියන 1,202 වූ අතර එය සියයට 28 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. බැංකුව තම සේවකයන් සහ රජය වෙනුවෙන් ඉකුත් වර්ෂයේ දී කරන ලද වෙන් කිරීම් පිළිවෙළින් රු.මිලියන 782 සහ රු. මිලියන 266 ක් සමග සැසඳීමේදී, සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් පිළිවෙළින් රු.මිලියන 1,027 සහ රු.මිලියන 307 වෙන් තර තිබුණි.

## 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.3.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බලපත්‍රලත් විශේෂිත බැංකුවල සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය හා ස්කන්ධය මත ප්‍රතිලාභය 2017 වර්ෂය සඳහා පිළිවෙළින් සියයට 1 සහ සියයට 19.2 ක් විය. කෙසේවෙතත්, 2017 වර්ෂය සඳහා බැංකුවේ ඉහත අනුපාතයන් පිළිවෙළින් සියයට 0.3 සහ සියයට 1.58 ක් පමණක් විය.

(ආ) සියයට 8.35 ක් වූ ආංශික අනුපාතය සමග සැසඳීමේදී, 2017 වර්ෂය සඳහා බැංකුවේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 1.58 ක් ලෙස වාර්තා විය.

(ඇ) සියයට 4.3 ක් වූ ආංශික අනුපාතය සමග සැසඳීමේදී, බැංකුවේ අක්‍රිය අනුපාතය (දළ) සියයට 10.10 ක් ලෙස වාර්තා කර තිබුණි.

## 3.4 සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට පරිනත විවර විශ්ලේෂණය (Maturity gap analysis)

| | ඉල්ලුම් කිරීමේදී (රු.'000) | මාස 03 දක්වා (රු.'000) | මාස 03 සිට 12 දක්වා (රු.'000) | වර්ෂ 1 සිට 3 දක්වා (රු.'000) | වර්ෂ 03 සිට 5 දක්වා (රු.'000) | වර්ෂ 5 කට වඩා වැඩි (රු.'000) | එකතුව (රු.'000) |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| මූල්‍ය වත්කම් | 1,145,550 | 6,361,615 | 9,472,681 | 12,695,973 | 4,362,205 | 519,539 | 34,557,563 |
| මූල්‍ය නොවන වත්කම් | - | 271,114 | 42,603 | - | - | 773,927 | 1,087,644 |
| **මුළු වත්කම්** | 1,145,550 | 6,632,729 | 9,515,284 | 12,695,973 | 4,362,205 | 1,293,466 | 35,645,207 |
| **හිමිකම් සහ වගකීම්** | | | | | | | |
| මූල්‍ය වගකීම් | 1,349,831 | 11,547,276 | 9,135,985 | 5,725,831 | 3,878,401 | - | 31,637,324 |
| මූල්‍ය නොවන වගකීම් | - | 129,893 | 7,473 | - | - | 636,697 | 774,063 |
| හිමිකම | - | 6,577 | - | - | - | 3,227,243 | 3,233,820 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | 1,349,831 | 11,683,746 | 9,143,458 | 5,725,831 | 3,878,401 | 3,863,940 | 35,645,207 |
| **පරිනත විවර විශ්ලේෂණය** | (204,281) | (5,051,017) | 371,826 | 6,970,142 | 483,804 | (2,570,474) | - |

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු, මගේ විස්තරාත්මක වාර්තා මගින් බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ආයෝජන දේපළ තක්සේරු කිරීම

(ආ) භෞතික ලෙස ඇති මුදල් සත්‍යාපනය කිරීම

(ඇ) අතැති චෙක්පත් පරිහරණය

(ඈ) බැංකු සැසඳුම් පිළියෙළ කිරීම

(ඉ) බැංකු ගිණුම් කළමනාකරණය කිරීම

(ඊ) ලැබිය යුතු බිල්පත් නිකුත් කිරීම